**මොරටුව මහා නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 අගෝස්තු 01 දින ද සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට මොරටුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් රු.1,076,375 ක් වටිනා පරිගණක හා උපාංග යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කිරීම නිසා යන්ත්‍රෝපකරණ ගිණුම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | 2019 ගිණුම සකස් කිරීමේ දී පරිගණක හා උපාංග වෙනම ගිණුම් තැබීම සිදු කිරීමට කටයුතු කරන අතර, දැනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමේ පවතින පරිගණක හා උපාංග යන්ත්‍රෝපකරණ ගිණුමෙන් ඉවත් කිරිමටද කටයුතු කරනු ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | කම්පැක්ටර් රථයේ අනතුර සම්බන්ධයෙන් වැරදිකරු වූ රියදුරුට ගෙවීමට නියම කරන ලද රු.3,001,717 ක මුදල රියදුරුගෙන් අයකර ගැනීමේ පදනම මත සභාව විසින් ගෙවා තිබුණද 2014 දෙසැම්බර් සිට 2019 පෙබරවාරි දක්වා රු. 112,205 ක මුදලක් අයකර ගෙන පසුව එම අයකිරීම නතර කර ඇති අතර සභාවට අයවිය යුතු රු.2,889,512 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | අලාභය අයකර ගත යුතු අතර අයවිය යුතු මුදල ගිණුම් තැබිය යුතුවේ. | වැරදිකරු වූ රියදුරු මහතාගෙන් රු.2,889,512 ක මුදලක් අයවීමට පවතින බව නිවැරදිය. 2019.03.07 දින මහා සභාවේදී සාකච්ඡා වූ පරිදි දැනට වැටුපෙන් අය කර ගැනීම තාවකාලිකව නතර කර ඇති මුදල 2019 ගිණුම සකස් කිරීමේ දී එවකට ලැබෙන තීරණය අනුව ගිණුම් තැබීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 05 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපලේඛනයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.28,555,480 ක් වැඩියෙන් සහ රු.10,069,291 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ඇ) **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | වටිනාකම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|---|
| (i) | සැහැල්ලු කසල ඉවත් කිරීම වෙනුවෙන් ලැබිය යුතු මුදල | 20,101,581 | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | පානදුර ප්‍රාදේශීය සභාවේ කසළ කරදියාන කසළ අංගනය වෙත බැහැර කිරීම වෙනුවෙන් ලැබිය යුතු මුදල | 1,297,188 | | |
| (iii) | වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු මුදල | 10,140,025 | | |
| (iv) | හිඟ ඉන්ධන ශේෂය | 371,167 | | |
| (v) | මස් වෙළඳසැල්වලින් ලැබිය යුතු මුදල | 653,805 | | |
| (vi) | අගරු චෙක්පත් | 805,180 | | |
| (vii) | පෙර ගෙවුම් ශේෂ | 1,293,192 | | |
| (viii) | හිඟ හිටි බලපත්‍ර ගාස්තු | 2,933,175 | | |
| (ix) | ලැබිය යුතු ආපන ශාලා ශේෂය | 86,820 | | |

(x) ලැබිය යුතු නිල නිවාස කුලී 47,635

| | | | |
|---|---|---|---|
| (xi) | වර්ෂ ගණනාවක සිට පැවත එන වරිපනම් බදු වංචා කිරීමෙන් සිදු වූ පාඩුව වන රු. 381,969 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද අලාභයෙන් රු. 241,749 ක් නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ අයකර ගැනීමට 2011 පෙබරවාරි 14 දින ලබාදුන් විනය නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (xii) | 2000 ජනවාරි 20 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක LG/3/2000 දරන චක්‍රලේඛය ප්‍රකාරව විනෝද බදු මුදල් සියයට 10 දක්වා අඩු කිරීම නිසා සභාවට අහිමි වූ රු.3,228,197 ක් වූ විනෝද බදු මුදල ලැබිය යුතු මුදලක් ලෙස ආදායම් ණයගැතියෝ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ලැබිය යුතු විනෝද බදු නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**ගෙවිය යුතු ගිණුම්**

-------------------

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ ගණනාවක සිට පැවත එන සංවර්ධන සංචිතය රු.10,000 ක් සහ නිදන් අරමුදල් ශේෂය රු.89,210 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් හඳුනාගෙන නිරවුල් කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.233,243,842 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා උපලේඛන හෝ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

1.4 <u>අනුකූල නොවීම.</u>

1.4.1 <u>**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**</u>

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) මහා නගර සභා ආඥා පනතේ (**252** අධිකාරය) 218 වගන්තිය | නගරාධිපතිවරයා විසින් එක් එක් මුදල් වර්ෂය තුලදී සභාවේ පරිපාලනය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාව සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 218 වගන්තිය අනුව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

-------------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | මු.රෙ. 156 | 2003 සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා යැවීම හා දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත රු.1,549,201 ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබූ අතර 2015 සිට 2019 අප්‍රේල් මස දක්වා ගෙවා තිබූ රු.969,733 ක අලාභය ඊට වගකිව යුතු අයගෙන් අයකර ගෙන නොතිබුණි. | මු.රෙ. 156 අනුව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| **(ii)** | | අත්තිකාරම් මුදල් අදාල කාලපරිච්ඡේදය තුළ විධිමත්ව පියවා ගැනීමට කටයුතු නොකිරීම නිසා වර්ෂ 15 සිට 17 දක්වා කාලපරිච්ඡේදයක් තුල සිදු වී ඇති පාඩුව වන රු.43,822 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | මු.රෙ. 156 අනුව කටයුතු කල යුතුවේ. | මේ සම්බන්ධ මූලික ලියවිලි අපහරණය කර ඇති බැවින් සභාවට සිදු වී ඇති අලාභයට වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර ගැනීමට අපහසු වී ඇත. |
| (iii) | | අංක 1329/මුදල් දරන සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුව සඳහා නීතිඥ ගාස්තු හා අනෙකුත් වියදම් වශයෙන් රු.919,512 ක් ද වන්දි මුදල වශයෙන් රු.10,275,362 ක් ද ගෙවා තිබූ අතර අදාල වගකිව යුතු නිලධාරින්ගෙන් සභාවට වැයවූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 156 අනුව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (iv) | මු.රෙ.396 | නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල මාස 06 ඉක්ම වූ රු.25,479 ක් වටිනා චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මු.රෙ.396 අනුව කටයුතු කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| **(v)** මු.රෙ.570 හා 571 | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.2,002,862 ක තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මු.රෙ.570 හා 571 අනුව කටයුතු කල යුතුවේ. | තැන්පතු ආදායමට ගැනීමට හා නිරවුල් කිරිමට කටයුතු කරමින් පවතී. |
| **(vi)** මු.රෙ.756 | රු.386,497,140 ක ස්ථාවර වත්කම් සහ තොග සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකෙරුණි. | මු.රෙ.756 අනුව කටයුතු කල යුතුවේ. | ගබඩා තොග සමීක්ෂණයට අදාල කටයුතු නිමවා ඇති අතර එහි වෙන්දේසි කිරීමේ කටයුතු සඳහා අදාල ලැයිස්තු මිශ්‍ර ආදායම් අංශය වෙත යොමු කර ඇත. අනෙකුත් විනාශ කිරීම් කටයුතු සඳහා කමිටු පත්කර දැනුම් දී ඇත. |
| (vii) මු.රෙ. 1653 | වාහන 33 ක වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා කාලපරිච්ඡේදයක් තුළ මයිලෝ මීටර් අක්‍රියව පැවතුණි | මු.රෙ. 1653 අනුව කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

**(ඇ) 2009 අංක 08 දරන මෝටර් වාහන (සංශෝධන) පනත**

| | | | |
|---|---|---|---|
| 16 වන ජේදය | කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව රථයේ මුල් ස්වභාවය වෙනස්වන පරිදි වාහන තුනක් රු.3,713,500 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි. | පනතේ 16 වන ජේදය අනුව කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| 05 වන ජේදයේ ( 2) අ වගන්තිය | වෙනස් කිරීම් සිදුකර ඇති වාහන පාවිච්චි නොකළ යුතු වුවත් ඉහත සඳහන් වාහන තුන සභාව විසින් දැනට පාවිච්චි කරමින් තිබුණි. | 05 වන ජේදයේ ( 2) අ වගන්තිය අනුව කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

**1.4 .2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම.** |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 188 (1) උපවගන්තියට පටහැනිව සභාවේ සභිකයන් 27 දෙනෙකු වෙනුවෙන් හදිසි අනතුරු | මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 188 (1) උපවගන්තියට පටහැනිව කටයුතු කිරිම නිසා සිදුව ඇති පාඩුව අයකල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් සඳහා සභා අරමුදලින් 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු. 953,715 ක් හා රු.1,086,807 ක් ගෙවීම් කර තිබුණද සභාවට අයවිය යුතු රු.1,703,022 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 503,990 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 36,705,215 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම (රු.) '000** | **බිල්කළ ආදායම (රු.) '000** | **රැස්කළ ආදායම (රු.) '000** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු.) '000** | **ඇස්තමේන්තු ගත ආදායම (රු.) '000** | **බිල්කළ ආදායම (රු.) '000** | **රැස්කළ ආදායම (රු.) '000** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු.) '000** |
| **වරිපනම් හා බදු** | 126,700 | 113,828 | 116,384 | 157,037 | 122,200 | 114,307 | 97,474 | 158,037 |
| **කුලී** | 13,024 | 12,676 | 12,780 | 2,786 | 13,373 | 13,752 | 14,504 | 2,313 |
| **බලපත්‍ර ගාස්තු** | 22,976 | 24,308 | 24,482 | 2,933 | 21,450 | 22,027 | 21,228 | 2,933 |
| **වෙනත් ආදායම්** | 680,265 | 508,316 | 524,686 | 109,828 | 642,832 | 507,038 | 509,751 | 114,719 |

2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 වර්ෂයේ අයවැයගත පුනරාවර්තන ආදායමින් සියයට 21.8 ක් ද අයවැයගත ප්‍රාග්ධන ආදායමෙන් සියයට 63.8 ක් ද උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ උපයා නොගත් මුළු ආදායම රු. 238,192,820 ක් විය. | ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

2.2.3 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) මහා නගර සභා ආඥාපනතේ 252 වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.153,808,391 ක් වූ අතර ඉන් රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 152 කින් අයවිය යුතු මුදල රු.91,333,962 ක් විය. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) වර්ෂ 05 කට වරක් දේපළ තක්සේරු කර වරිපනම් බදු අය කිරීම කළ යුතු වුවද සභාව විසින් 2008 වර්ෂයෙන් පසු දේපළ තක්සේරු කර නොතිබුණි. | වර්ෂ 05 කට වරක් දේපළ තක්සේරු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

2.2.4 <u>කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) ගිවිසුම්වලට එළඹීමෙන් තොරව අවස්ථා 39 කදී කඩ බදු දී තිබූ අතර එම කඩ කාමර වලින් අයවිය යුතු කඩ කුලිය රු. 663,366 ක් විය. | අයවිය යුතු කඩ කුලිය නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතු අතර බදු දීමේදි ගිවිසුම් ගත විය යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) 2018 වර්ෂය සඳහා දිගු කාලීනව බදු දෙන කඩකාමර වලින් අයවිය යුතු බිල්කල ආදායම රු.5,135,955 වුවද ඉන් රු.400,526 ක් අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි. | අයවිය යුතු කුලිය නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) 2018 ජනවාරි 01 දිනට රු. 2,416,341 ක් වූ සමුච්චිත හිඟ ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 887,214 ක් හෙවත් සියයට 36.7 ක් අයකර ගෙන තිබූ අතර ඉන් වාරික 10 වැඩි හිඟ හිටි දේපල 34 කින් රු.898,208 ක් අයවිය යුතුව පැවතුණි. | අයවිය යුතු කුලිය නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බදු ගිවිසුමේ කොන්දේසි අංක 04 අනුව මාස 03 කට වැඩියෙන් හිඟ බදු පවතින කඩ කාමර නගර සභාවට පවරා ගැනීමට කටයුතු කල යුතු වුවත්, මාස 03 සිට මාස 113 දක්වා කාල පරාසයක් තුළ රු.1,263,653 ක් කඩ කුලී හිඟව ඇති කඩ කාමර 65 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ කඩකුලිය නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

2.2.5 <u>මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල මුද්දර ගාස්තු ආදායම රු.128,000,000 ක් වුවද ඉන් රු.74,049,705 ක් හෙවත් සියයට 57.85 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | වර්ෂයට අදාල මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1. <u>කාර්ය සාධනය</u>

(අ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට පෙර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර විධිමත් පරිදි අනුමත කර ගෙන නොතිබූ අතර 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් ක්‍රියාකාරකම් සඳහා ගතවන කාලසීමාව හා කාර්යසාධනය පැහැදිලිව හඳුනා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු දක්වා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම පැහැදැලිව සකස් කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

(ආ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂය සඳහා අයවැය ගත කසළ ආදායම රු. 15,000,000 ක් වුවද සත්‍ය කසළ ආදායම රු. 9,282,165 ක් වී තිබුණි. | අයවැය ගත කසළ ආදායම ලඟාකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.10,629,723 ක කසළ බදු හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුල රු.1,423,177 ක් පමණක් අයකර ගෙන තිබුණි. | ලැබිය යුතු කසළ බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (iii) | කසළ බැහැර කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී අංගනයට ගෙවූ මුදල රු.23,698,320 ක් වූවද 2018 දෙසැම්බර් 31 දිනට රු. 7,910,002 ක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. | කසළ බැහැර කිරීමේ වියදම් පියවිය යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (iv) | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත) විසින් 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ මුදලක් ලෙස සභාව වෙත දන්වා තිබූ නමුත් සභාවේ පොත් වල සටහන් නොවූ රු.22,063,395 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයටත් නිරවුල් කර නොතිබුණි. | නිරික්ෂණය පිළිබඳ අවධානය යොමු කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම.** |
|---|---|---|
| 2009,2010 හා 2011 යන වර්ෂයන්ට අදාල එකතු කළ අගය මත බදු වාර්තා නියමිත දිනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.10,818,002 ක දඩ මුදලක් ද සමඟ රු.31,059,351 ක පැහැර හරින ලද එකතු කළ අගය මත බදු මුදලක් ගෙවන ලෙස 2014 හා 2017 වර්ෂයන්හී සභාවට නියෝග කර තිබුණද ඉදිරිපත් කරන ලද අභියාචනා වලට අනුව බදු වගකීමෙන් සභාව නිදහස් කර නොතිබුණි. එමෙන්ම 2005,2006 හා 2008වර්ෂයන්ට අදාල පැහැර හරිනු ලැබූ එකතු කළ අගය මත බදු වෙනුවෙන් පනවා තිබූ රු.421,328 ක දඩ මුදල ගෙවීමට සභාව එකඟතාවය පළකර තිබුණි. | අදාල බදු මුදල් නියමිත දිනට ගෙවීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

3.3. <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 81 ක් පැවතුණි. ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලයට අමතරව ව්‍යාපෘති, කොන්ත්‍රාත්, තාවකාලික හා ආදේශන පදනම මත තනතුරු 04 ක් සඳහා බඳවාගෙන තිබු සේවකයන් 118 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.42,422,094 ක් ගෙවා තිබුණි. | සේවකයන් බඳවා ගැනීමේදී ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය ලබා ගත යුතු අතර වර්ෂය මුලදී අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල නිත්‍ය තනතුරෙන් බැහැරව වෙනත් තනතුරු වල සේවකයන් 45 දෙනෙකු යොදවා තිබුණි. | නිත්‍ය තනතුරේ රාජකාරි සඳහා යොදා ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඈ) | 2018 මාර්තු සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදයට අදාලව සේවකයන් 38 ක් අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැර ගොස් තිබූ අතර සෞඛ්‍ය පාලකවරයෙකුද ඇතුළුව සභාවේ සේවකයන් කීපදෙනෙක් සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව අවසරයකින් තොරව ප්‍රදේශයෙන් බැහැරව දිය නෑමට ගොස් සිටියදී එක් සේවකයෙකු 2019 පෙබරවාරි මාසයේ දියේ ගිලී මියගොස් තිබුණි.ඒ අනුව සේවකයන් සම්බන්ධව අධීක්ෂණය හා පාලනය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | නිසි සේවක කළමනාකරණයක් තිබිය යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඉ) | වැඩ තහනම් කල හා සේවය හැර ගිය නිළධාරීන් 33 දෙනෙකුගෙන් රු.1,198,358 ක් ද ,මියගිය හා විශ්‍රාම ගිය නිළධාරීන් 17 දෙනෙකුගෙන් රු.450,312 ක් ද,ස්ථාන මාරු වී ගිය නිලධාරින් 8 දෙනෙකුගෙන් රු.351,421 ක් ද වශයෙන් එකතුව රු.2,000,091 ක් වු ණයශේෂ වලින් | ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුවේ. | ණය ශේෂ අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | | |
| (ඊ) | අක්‍රීය ණය ශේෂ ලේඛනයේ ඇතුලත් නිලධාරින් 127 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය වූ රු.1,545,627 ක මුදල නිරවුල් කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | ණයකරුවන් ණය පැහැර අරින අවස්ථාවන්හි ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කල යුතුවේ. | අක්‍රීය ණය ශේෂ ලේඛනයේ ඇතුලත් නිලධාරීන් 127 දෙනාගේ ණය ශේෂ අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|

### 3.4.1 ඩෙංගු මර්දන වැඩසටහන්

| | | |
|---|---|---|
| මහා නගර සභා බල ප්‍රදේශය සඳහා ඩෙංගු රෝග මර්දන ක්‍රියාකාරී සැලැස්මක් 2016, 2017 හා 2018 වර්ෂයන්ට අදාලව පිළියෙල කර නොතිබූ අතර 2018 වර්ෂයේදී ඩෙංගු රෝග මර්දනය වෙනුවෙන් සභාව රු.1,430,310 ක් වැය කර තිබුණි. 2018 වර්ෂයේ නිකුත් කර තිබූ රතු නිවේදන සංඛ්‍යාව 1371 ක් වූ අතර ඩෙංගු කීටයන් පැවති ස්ථාන 327 කින් ස්ථාන 208 ක් සඳහා නඩු පවරා තිබුණි. එමෙන්ම 2018 වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුළ වාර්තා වී තිබූ රෝගීන් සංඛ්‍යාව 581 ක් වූ අතර එක් ඩෙංගු රෝග මරණයක් වාර්තා වී තිබුණි. | ඩෙංගු මර්දන වැඩසටහන් විධිමත්ව ක්‍රියාත්මක කල යුතු අතර ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 3.4.2 සොයිසා ක්‍රීඩාංගනයේ පරිපාලනය

| | | | |
|---|---|---|---|
| (අ) | ද සොයිසා ක්‍රීඩාංගනය වෙන් කිරිමේදි සභාව විසින් නියම කරගත් නිශ්චිත ගාස්තු පදනම් කරගෙන අයකිරිම් සිදු නොකිරීම නිසා අඩුවෙන් මුදල් අයකළ අවස්ථා 07 ක් සඳහා සභාවට රු.234,500 ක් අහිමි වී තිබුණි. | පාඩුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | ක්‍රීඩාංගනය වෙන් කිරිමේදි අයකරනු ලබන ආරක්ෂිත ඇප තැන්පත් නිදහස් කිරිමේදි නිසි පරිදි ලේඛන ගත කළ යුතු වුවත් 2018 සැප්තැම්බර් 20 දින | ආරක්ෂිත ඇප තැන්පත් නිදහස් කිරිමේදි නිසි පරිදි ලේඛන ගත කළ යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | වන විට අවස්ථා 40 කදි නිදහස් කරන ලද රු.289,000 ක මුදල සම්බන්ධයෙන් කිසිදු සටහනක් ලේඛන ගතකර නොතිබුණි. | | |
| (ඇ) | ක්‍රීඩාංගනය භාවිතා කිරීමේදී සිදුවිය හැකි අලාභ හානි අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා, ඇප තැන්පත් මුදලක් ලබා ගැනීමට නියම කර තිබුණද, අවස්ථා 23 ක දී රු.115,000 ක ඇප තැන්පත් අයකර නොතිබුණි. | ක්‍රීඩාංගනය වෙන්කිරීමේදි අදාල නිතිරිති වලට අනුකූලව කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ක්‍රිකට් පුහුණු වීමේ තීරු තුනෙන් පුහුණු වීමේ තීරු දෙකක් වර්ෂ 2 ක කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබු අතර එම තීරු තුන වෙන් කිරීම සඳහා සවිකර ඇති දැල් ඉරි ගොස් ඉතා අබලන් තත්ත්වයේ පැවතුණි.එමෙන්ම දෙපස තීරු වල සවිකර ඇති මර්කරි බල්බ් 10 ක් අක්‍රිය තත්ත්වයේ පැවතුණු අතර එම තීරු පුහුණුවීම් කටයුතු සඳහා යොදාගැනීමට නොහැකි වීමෙන් සභාවට ලැබීමට තිබු ආදායම් අහිමි වී තිබුණි. | ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන් ආදායම් ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

**3.4.3 සොයිසා ක්‍රීඩාංගනය තුල ‘‘මොරටුව ක්‍රීඩා සමාජය’’ නමින් ඉදිකරන ලද දෙමහල් ගොඩනැගිල්ල**

---------------------------------------

| | | | |
|---|---|---|---|
| (අ) | සොයිසා ක්‍රීඩාංගනය තුල ‘‘මොරටුව ක්‍රීඩා සමාජය’’ නමින් දෙමහල් ගොඩනැගිල්ලක් ස්ථාපනය කර තිබු අතර පහත මහල හා උඩු මහල සභාවේ අවසරයකින් තොරව තෙවැනි පාර්ශවයක් වූ සමාජ ශාලාවකට (Club House) හා ශරීර සුවතා මධ්‍යස්ථානයකට ‘‘මොරටුව ක්‍රීඩා සමාජය’’ විසින් බදු දී මසකට පිළිවෙළින් රු. 25,000 ක් හා රු.30,000 ක් බැගින් උපයා තිබුණි.එමෙන්ම ක්‍රීකට් තරඟ පවත්වන දිනවල මොරටුව ක්‍රීඩා සමාජය විසින් විශාල මුදලක්ද උපයන බව අනාවරණය විය. | නීති විරෝධි ලෙස තෙවැනි පාර්ශවයන්ට බදු දීම සිදු නොකල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1975 අංක 17 දරන සමාජ ශාලා පනත යටතේ සමාජ ශාලාව ලියාපදිංචි කර නොතිබූ අතර ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා වෙළඳ බලපත්‍රයක්ද ලබා ගෙන නොතිබුණි. | සමාජ ශාලාව ලියාපදිංචි කල යුතු අතර ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා වෙළඳ බලපත්‍රයක් ලබා ගත යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් අරමුදල් ලබා ගෙන සමාජ ශාලා පරිශ්‍රය වැඩි දියුණු කිරීමට කටයුතු කර තිබුණද ඒ සඳහා සභාවේ එකඟතාවය ලබා ගෙන නොතිබුණි. | සභාවේ එකඟතාවය ලබා ගත යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඈ) | සභාවේ බදු නීති ප්‍රකාරව සභාව සතු දේපලක් තෙවැනි පාර්ශවයකට බදු දීමට බදුකරුට නීතිමය ප්‍රතිපාදන නොමැති අතර එසේ බදු දුන් අවස්ථාවකදී ගිවිසුම අවලංගු කර අදාල දේපල සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. එමෙන්ම සභාව සතු මෙම දේපලෙන් උපරිම ආදායමක් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි. | අතුරු බදු දිම නිසා ගිවිසුම අවලංගු කර දේපල සභාව වෙත පවරා ගැනිමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 3.4.4 ගිනි නිවීම් සේවාව

| | | | |
|---|---|---|---|
| (අ) | දිවා, රාත්‍රි සේවය සපයන ගිනි නිවීමේ අංශය සඳහා මූලික ගිනිභට, පළමු පෙළ ගිනිභට හා මෝටර් යාන්ත්‍රික ගිනිභට යන ප්‍රධාන සේවා කාණ්ඩ 03 ට අයත් අනුමත ගිනිභට නිලධාරීන් 09 දෙනෙකුගේ තනතුරු 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | ගිනි නිවීමේ අංශය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය අයිතම 26 කට අදාල උපකරණ 256 ක් ගිනි නිවීමේ අංශයේ නොතිබුණි. | අත්‍යවශ්‍ය සේවාවක් වන ගිනි නිවීමේ අංශය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) | සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි ස්ථාන සඳහා ද ගිනි නිවීම් සේවාව ලබා දෙන බැවින් එම ප්‍රදේශවලට අයත් සභාවන් සමඟ ගිවිසුම්ගත වී ගිනි නිවීම් සේවාව වඩාත් ඵලදායි හා පුළුල් ලෙස ව්‍යාපෘත | ගිවිසුම්ගත වී ගිනි නිවීම් සේවාව වඩාත් ඵලදායි හා පුළුල් ලෙස ව්‍යාපෘත කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු අතර උස් | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබූ අතර උස් ගොඩනැගිලි සඳහා ගිනි ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | ගොඩනැගිලි සඳහා ගිනි ආරක්ෂණ බලපත්‍ර නිකුත් කල යුතුවේ. | |
| (ඇ) | එමෙන්ම ගිනි නිවීම් සේවා කාර්ය මණ්ඩලය වෙනුවෙන් ජීවිත රක්ෂණාවරණයක් ලබාදීමට සභාව කටයුතු කර නොතිබුණි. | ජීවිත රක්ෂණාවරණයක් ලබා දිය යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඉ) | ගිනි නිවීම් අංශයේ සේවකයින්ගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරිමේ ක්‍රමවේදයක් මෙන්ම ඔවුන්ගේ සේවය ඇගයීමේ ක්‍රමවේදයක්ද ක්‍රියාත්මකව නොතිබුණි. | සෞඛ්‍ය තත්වය හා කාර්යසාධනය ඇගයිමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඊ) | 1985 හා 2006 වර්ෂ වල සභාව වෙත ලැබී තිබූ රු.2,600,000 ක් වටිනා ගිනි රථ 2 ක් 2018 වර්ෂය අවසාන වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. | ගිනි රථ ලියාපදිංචි කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

**3.4.5 පෙර පාසැල් කාර්යසාධනය**

| | | | |
|---|---|---|---|
| (අ) | 2013 සැප්තැම්බර් 04 දිනැති අංක 1826/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් බස්නාහිර පළාත් සභාවේ 2013 අංක 01 දරන පෙර පාසැල් ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රකාරව පලාත තුල ලියාපදිංචි කල යුතු පෙර පාසැල් 09 ක් ලියාපදිංචි කර නොතිබූ අතර ප්‍රඥප්තියේ 21 VII වැනි කොටස ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති ගුරුවරියන් 26 දෙනෙකු ලියාපදිංචි කර හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2013 අංක 01 දරන පෙර පාසැල් ප්‍රඥප්තිය අනුව කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | ප්‍රඥප්තියේ 12 (ඌ) වගන්තිය අනුව දරුවන් සඳහා 20:1 අනුපාතයට ලියාපදිංචි ගුරුවරියන් යොදා ගත යුතු වුවද පෙර පාසැල් දරුවන් 480 දෙනෙකු සඳහා ලියාපදිංචි ගුරුවරියන් 14 දෙනෙකු යොදා ගෙන තිබුණි. | ප්‍රඥප්තියේ 12 (ඌ) වගන්තිය අනුව කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) | ඉහත ගැසට් පත්‍රයේ සඳහන් බස්නාහිර පළාත් සභාවේ 2013 අංක 01 දරන පෙර | 2013 අංක 01 දරන පෙර පාසැල් ප්‍රඥප්තිය අනුව | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | |
|---|---|---|
| පාසැල් ප්‍රඥප්තියේ II කොටස අනුව පෙර පාසැල් ඒකකයේ අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ යුතු පරිපාලනය, අධීක්ෂණය හා මෙහෙයවීම සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | කටයුතු කල යුතුවේ. | |

3.5 **වත්කම් කළමනාකරණය**

**----------------------------**

3.5.1 **<u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (අ) | මොරටුව මහා නගර සභාව සතු අක්කර 02 රූඩ් 01 පර්චස් 11 ක් විශාල ඉඩම් 19 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි. | සභාව සතු ඉඩම් භාවිතයට ගත යුතුය. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.4,664,460 ක ශේෂයක් ඇති සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමෙන් වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් සිදුව නොතිබුණි. | සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම ස්ථාවර තැන්පතුවකට මාරු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඇ) | එන්ජිම අළුත්වැඩියා නොකිරීම නිසා වසර 02 සිට වසර 18 දක්වා කාලයක් ධාවනයෙන් ඉවත් කර ඇති වාහන 17 ක් අක්‍රියව පැවතුණි. | අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඈ) | මොරටුව නගර මධ්‍යයෙහි පිහිටි ඉදිකිරීම් සම්පූර්ණ කර නොමැති රංගන ශාලාව වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඉ) | සභාව සතු නිල නිවාස 7 ක් 2009 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයක් තුළ භාවිතයට ගෙන නොතිබුණි. | නිශ්ක්‍රීයව ඇති නිල නිවාස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | මධ්‍යම වෙළඳපොළ ගොඩනැගිල්ලේ දෙවන මහල 2010 ඔක්තෝබර් 31 දිනෙන් පසු බදු දීමට කටයුතු කර නොතිබූ අතර එමගින් සභාවට ලැබිය යුතු ආදායමද අහිමි වී තිබුණි. | මධ්‍යම වෙළඳපොළ ගොඩනැගිල්ල බදු දී ආදායම් ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (උ) | නව විදුලි උත්පාදන යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක තත්වයේ පැවති විදුලි උත්පාදන යන්ත්‍රය 2010 ජූලි 28 දින සිට භාවිතයෙන් ඉවත්කර තිබූ අතර එය සභා පරිශ්‍රය තුළ නිශ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ඌ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් 2017 සැප්තැම්බර් 13 දින සභාව වෙත ලබා දී තිබූ රු.632,500 ක් වටිනා බේලිං යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | බේලිං යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනීමට හෝ අවශ්‍යතාවය ඇති ආයතනයකට ලබා දිය යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (එ) | ලුනාව ව්‍යාපෘතියෙන් ලද වාහන අමතර කොටස් ඒකක 1711 ක් 2010 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 3.5.2 වාහන උපයෝජනය

-----------------------

| | | |
|---|---|---|
| සභාව වෙත ලැබී වර්ෂ 11 සිට වර්ෂ 33 දක්වා කාලයක් ගත වී තිබූ වාහන 07 ක් සමාලෝචිත වර්ෂය අවසානයටත් ලියාපදිංචි කර නොතිබුණි. | වාහන ලියාපදිංචි කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 3.5.3 දෘශ්‍ය අක්‍රමිකතා

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වරිපනම් අංශයේ පරිඝණක සේවයට අනුයුක්ත කර ඇති සේවකයන් පොදු මුරපදය (Common Pass word) භාවිතා කරමින් 2018 වර්ෂයේ අවස්ථා 10 කදී රු.105,893 ක් වටිනා බිල්පත් අවලංගු කර වරිපනම් බදු අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි.වගකිව යුතු මාණ්ඩලික | අක්‍රමිකතාවයට සම්බන්ධ නිලධාරින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

නිලධාරියෙකු සතුව පවතින රහස් මුර පදයද (Secret Pass word) ව්‍යාජ ලෙස භාවිතා කර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (අ) | 2018 වර්ෂයේ අයවැයගත පුනරාවර්තන වියදමින් සියයට 21.82 ක්ද අයවැයගත ප්‍රාග්ධන වියදමින් සියයට 57.13 ක්ද වර්ෂය තුළ දී උපයෝජනය කර නොතිබූ අතර උපයෝජනය කර නොතිබූ මුළු ප්‍රතිපාදනය රු.250,597,904 ක් විය. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුවේ. | ප්‍රාග්ධන ආදායම් ලැබී නොමැති බැවින් ප්‍රාග්ධන වියදම් වර්ෂය තුල දරා නොමැත. |
| (ආ) | වියදම් ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව අයවැය ප්‍රතිපාදනය රු.11,220,000 ක් වූ පුනරාවර්තන වියදම් ශීර්ෂ 141 කින් හා රු.62,279,800 ක් වූ ප්‍රාග්ධන වියදම් ශීර්ෂ 43 කින් සමාලෝචිත වර්ෂය තුළදි කිසිදු වියදමක් දරා නොතිබුණි. | අවශ්‍යතාවය ඇති ශිර්ෂ සඳහා ප්‍රතිපාදන මාරු කල යුතුවේ. | ශීර්ෂ 127 හෝ 90 % ක් සංකේත ප්‍රතිපාදන මගින් වෙන්කර ඇති වියදම් වේ. |
| (ඇ) | පළාත් සභා විමධ්‍යගත ආධාර සංකේත අංක 33528 II ඉදිකිරීම් ඉඩම් නිර්මාණ වැය යටතේ රු.50,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද වියදම රු.22,463,772 ක් වුයෙන් ඉතිරිය රු.27,536,228 ක් හෙවත් සියයට 55 ඉක්මවා තිබුණි. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුවේ. | පළාත් සභා විමධ්‍යගත ආධාර යටතේ ඉදිකිරිම් ඉඩම් නිර්මාණ වැය වෙනුවෙන් අපේක්ෂා කල ඇස්තමේන්තුගත ආදායම නොලැබීම හේතුවෙන් එම ඉදිකිරිම් කටයුතු සඳහා වියදම දැරීමට සිදු නොවී ඇත. |
| (ඇ) | ඇස්තමේන්තු ගත මුළු ආදායම තුළ ඇතුළත් එකතුව රු. 24,134,000 ක් වූ ආදායම් ශීර්ෂ 30 කින් 2018 වර්ෂය තුළ දී කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණි. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුවේ. | ආදායම් උපයා ගැනිමට නොහැකි වූ හේතු දන්වා ඇත. |